එය හඳුන්වන්නේ මහා රෝගයක් ලෙසයි. සුව නොවීමට හේතුව ගුද මග අසල නිතර විෂබීජ ගැවසෙන නිසා. මෙම රෝගය බහුලව ඇතිවන්නේ හිඳගෙන රැකියාව කරන අයට. ආයුර්වේදයේ දක්වා ඇත්තේ අසුන් හා ඇතුන් පිට තද ආසනවල හිඳ නිතරම ගමන් යන අයට. මේ ලෙඩ හැදෙන බවයි. අද නම් දුණු කැඩුණ සීට්වල (ප්‍රයිවෙට් බස්වල) ට්‍රැක්ටර් සීට්වල යන අයට මෙය හැදෙන්නට ඉඩ තිබෙනව. ඒ වගේම අභිඝාත (වැටීම්, ඇනීම් වැනිදේ) හරහාද හගන්දර ඇතිවෙනව. ඉතා තද මල (ඝනවූ) වෙර යොදා පිටකිරීමට යාමේදීත් ගුද මගේ ඇතිවන තුවාල වැනිදේත් මෙයට හේතු වෙනව.

මීට ප්‍රතිකාර ලෙස නව්‍යයේ සිදුකරන්නේ හගන්දරය කපාදැමීමයි. නමුත් ඇතිවන තුවාලය පහසුවෙන් සුවවන්නේ නැහැ. එය රෝගියාට දැඩි දුකක්. එනිසා රෝගය හඳුනා ගන්නේ කෙලෙසද යන්න වැදගත්.

මේ රෝගයේ විශේෂ ලක්ෂණය ගුද මහ අසල කුඩා සැරව ගෙඩියක් ඇතිවීමයි. මෙය පුපුරා ගොස් පිටතින් සුවවෙනව. නමුත් ඇතුළත තවම තුවාලය සුව නොවී තිබෙනව. ඇතුළත සැරව එකතුවීම නිසා නැවත නැවතත් සැරව පිටවෙන්න ගන්නව. මෙහි බාහිරයට පෙනෙන තරමට වඩා අභ්‍යන්තරයට ගමන්ගත් ඔඩු වණයක් තිබෙන බව හඳුනාගත හැක්කේ රෝගියා පරීක්ෂා කිරීමෙන් පමණයි.

නූලක බෙහෙත් කවා ගුදමගට යැවීම මගිනුයි ප්‍රතිකාර කෙරෙන්නෙ. ප්‍රතිකාර ලෙස කෙරෙන්නේ නාඩියන්ත්‍රයක් (ලෝහමය කූරක්) මගින් හගන්දර මග සොයාගෙන රය ගුදමගට විවෘත වී තිබේ නම් එය උපකාර කරගෙන ක්ෂාර සූත්‍රයක් (බෙහෙත් නූලක්) ඒ ඔඩු වණ මග හරහා යවා ගැටගැසීමයි.

මේ නූලේ ඔසු මගින් එම හගන්දර මග ඉදිරියට කැපෙන අතරම පිටුපසින් සුවවෙනව. මේ සූත්‍රය සතියකට වරක් මාරු කෙරෙනව. හගන්දර මගේ දිග අනුව සම්පූර්ණයෙන් සුවවීමට ගතවන කාලය වෙනස් වනව.

❑

**සාකච්ඡා කළේ - මනෝජ්**

## දස්කම් විස්කම්

# ලාංකීය සිසුවකු තැනූ මෝටර් රථය “රජීව් 2000”

ඓතිහාසික පානදූරා වාදය හේතු කොට ගෙන බෞද්ධ ජනතාවගේ මහත් ගෞරවාදරයට බෞද්ධ පුනර්ජීවන නගරය වන පානදුර නගරය පත් විය.

මහා දනපතියන්, ගත් කතුවරුන්, විද්‍යාඥයන්, උගතුන් බිහිවූ පානදුර නගරය, එද මෙන් ම අදත් ඒ නාමය රැක ගැනීමට සමත්ව සිටී.

තොබෝදා කළුතර විද්‍යාලයේ පැවති කළුතර දිස්ත්‍රික් කලාපිය වසර 2000 නව සහශ්‍ර අධ්‍යාපන ප්‍රදර්ශනයේ දි සැම දෙනාගේ ම සිත ඇදි ගියේ පානදුර ශ්‍රී සුමංගල විදුහලේ උසස් පෙළ විද්‍යා අංශයේ ඉගෙනුම ලබන 18 හැවිරිදි රජීව් රවීන්ද්‍රනාත් ප්‍රනාන්දු ශිෂ්‍ය විසින් නිෂ්පාදනය කරන ලද 'රජීව් 2000' නමැති මෝටර් රථය වෙත යි. පෙට්‍රල් ඉන්ධන වලින් ක්‍රියා කරන මෙම මෝටර් රථයේ ධාරිතාව 1400 cc වේ. දෙදෙනෙකුට පමණක් ගමන් කළ හැක. ටයර 155x13 ප්‍රමාණයෙන් ද ගියර 5 කින් ද, දොර දෙකකින් ද සමන්විත ය. පෙට්‍රල් ගැලුමකට සැතපුම් 40 ක් ගමන් කිරීමේ හැකියාව එයට ඇත.

සාමාන්‍ය මෝටර් රථයක් මෙන් සියලුම අංගෝපාංග වලින් සමන්විත මොහුගේ මේ නිෂ්පාදනය පළපුරුදු මෝටර් රථ කාර්මිකයන් ගේ පවා ප්‍රසාදයට ලක්වී ඇත.



මෝටර් රථය

මෙම මෝටර් රථය නිෂ්පාදනය කිරීම සඳහා ඔහු උපයෝගී කරගෙන ඇත්තේ තම පියා වන පානදුර නාගරික මන්ත්‍රී විජිත් ප්‍රනාන්දු මහතාගේ මෝටර් රථ ආයතනයේ වාහනවල අබලන් කොටස් ය. වාහනය නිම කිරීම සඳහා වැයවූ මුදල රු. 75,000 ක් පමණ වේ.

බස්නාහිර පළාතේ මහ ඇමති සුසිල් ප්‍රේමජයන්ත, අධ්‍යාපන හා උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමති රෙජිනෝල්ඩ් කුරේ, බුද්ධශාසන නියෝජ්‍ය ඇමති එදිරිවීර ප්‍රේමරත්න, සුමිත්‍රා ප්‍රියංගනී යන මහත්ම, මහත්මීන් ඇතුළු අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉහළ නිලධාරීන්ගේ ද පළාත් සභා මන්ත්‍රී වරුන්ගේ ද සහභාගිත්වයෙන් මෙම අධ්‍යාපන ප්‍රදර්ශනය දින 3 ක් පැවැත් විණ.

**සේයාරුව - ගීත් ද මෙල්**




රජීව් ප්‍රනාන්දු, ඔහු නිර්මාණය කළ “රජීව් 2000” මෝටර් රථය සමඟ